සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **කතෝලික ධර්මය I** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ වර්ගීකරණය යටතේ 'විලාප ගී' ග්‍රන්ථය අයත් පොත් කාණ්ඩය වන්නේ,
(1) ඉතිහාස පොත් (2) ප්‍රඥා සාහිත්‍යය (3) දිවැසිවර ග්‍රන්ථ (4) නීති පොත්

02. ජෝෂුවාගේ සිට 2 රාජාවලිය දක්වා පොත් අධ්‍යයනයේදී පැහැදිලි වන්නේ,
(1) දස පනතට අනුව ජීවත් වීමය. (2) වැඩිහිටි අවවාද පිළිපැදීමය.
(3) පරිත්‍යාගශීලීව කටයුතු කිරීමය. (4) විශ්වාසවන්තව ජීවත් වීමය.

03. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම අනුව අවසාන පරිච්ඡේද 15 හි දක්වා ඇත්තේ,
(1) ධර්මදූත සේවයට සූදානම ය. (2) ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය ය.
(3) ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම ය. (4) ජෙරුසලමේ සාක්ෂි දැරීම ය.

04. සංදේශ වර්ගීකරණය යටතේ 'රෝම ලිපිය',
(1) ශුද්ධවූ පාවුලුතුමා විසින් ම ලියන ලද සංදේශයකි.
(2) ද්විතීය පාවුලු සංදේශයකි.
(3) ආරූඪ කතෘත්වය සහිත සංදේශයකි.
(4) වෙනත් සංදේශයකි.

05. එළිදරව්ව පොත ලේඛනගත කළේ යැයි සැලකෙන කාලය වන්නේ,
(1) ක්‍රි.ව. 90 - 100 අතර (2) ක්‍රි.ව. 80 - 85 අතර
(3) ක්‍රි.ව. 80 - 96 අතර (4) ක්‍රි.ව. 64 - 66 අතර

06. සංකල්පනා ඇසුරෙන් පුරාණ ගිවිසුම තුළ ප්‍රඥාව ඉදිරිපත් කර ඇති ග්‍රන්ථය වන්නේ,
(1) උපදේශකයා හෙවත් සිරාක්ය (2) හිතෝපදේශය ය
(3) ප්‍රඥාවය (4) ධර්මදේශකයා ය

07. පෙන්තකොස්ත දින පේදුරුතුමා තම දේශනය කරන ලද්දේ,
(1) සුදර්ශන දොරටුව අසල දී ය. (2) ජෙරුසලම් චතුරස්‍රයේ දී ය.
(3) ජොප්පාවේ දී ය. (4) බෙතානියේ දී ය.

08. අපෝස්තුලුවරුන් දොළොස්දෙනා අතරින් පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා වන්නේ,
(1) කුඩා ජාකොබ් තුමාය. (2) මහා ජාකොබ් තුමාය.
(3) ස්තේපන් තුමාය. (4) තෝමස් තුමාය.

09. ශුද්ධවූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමනේ දී පසුව එක් වූ අයවන්නේ,

(1) තිමෝතියස්තුමා හා ලූක් තුමාය. (2) සීලස්තුමා හා ලූක් තුමාය.

(3) බර්ණබස්තුමා හා ජොහාන් මාක් තුමාය. (4) බර්ණාබස්තුමා හා තිමෝතියස් තුමාය.

10. තෙවන ධර්මදූත චාරිකාවෙන් පසු පාවුලුතුමා දේව මාළිගයේ දී අත්අඩංගුවට ගැනීමට චෝදනා කරන්නේ,

(1) ආසියාවෙන් පැමිණි ජුදෙව්වරුන් ය. (2) සමාරියෙන් පැමිණි ජුදෙව්වරුන් ය.

(3) ජෙරුසලමේ සිටි ජුදෙව්වරුන්ය. (4) අන්තියෝකියෙන් පැමිණි ජුදෙව්වරුන් ය.

11. ශුද්ධවූ සභාවේ නායකත්වයට පේදුරුතුමන් පත්කරනු ලැබූ ස්ථානය වන්නේ,

(1) තාබෝර් කන්දය. (2) කපර්ණාවුමය.

(3) පිලිප්පි කයිසාරියය. (4) සේනාකුළු ශාලාවය.

12. ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ මෙරට කතෝලිකයන් මුහුණ පෑ ප්‍රධාන ම ගැටලුව වූයේ,

(1) අප්‍රසිද්ධියේ හෝ කතෝලික දහම ඇදහීම තහනම් වීමය.

(2) සියලු ම පාසල්වල රෙපරමාදු දහම පමණක් ඉගැන්වීම ය.

(3) දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් කිරීමය.

(4) කිසිදු කතෝලික පූජකයෙකු නොමැතිවීමය.

13. ශුද්ධවූ පාවුලුතුමා ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ලෙස හඳුන්වා දී ඇත්තේ,

(1) දිව්‍ය සත්ප්‍රසාදයය. (2) ශුද්ධවූ සභාවය.

(3) අමරණීය ආත්මයය. (4) ශුද්ධවූ ත්‍රිත්වයය.

14. 'යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේද, මාගේ රුධිරය පානය කරන්නේද ඔහුට සදාතන ජීවනය ඇත.' මෙම ප්‍රකාශයට අදාළ දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයකි.

(1) භෝජනය (2) යාගය (3) ගිවිසුම (4) පරිශ්‍රමණය

15. ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න.'' මෙම ක්‍රිස්තු ප්‍රකාශය තුළින් ඉස්මතු කරන්නේ,

(1) දේව ආදරය අත්දැකිය යුතු බවයි.

(2) මෙලොව අප ජීවත් විය යුතු ආකාරයි.

(3) අන්‍යයන්ට ප්‍රේම කළ යුතු බවයි.

(4) දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතේ යථාර්තයයි.

16. නව ගිවිසුමේ පාස්කු බැටළුවාගේ තැන ගන්නේ,

(1) නොකැළැල් බැටළු පැටවා ය. (2) දේවස්ථානයේ පියතුමාය.

(3) ක්‍රිස්තුන් වහන්සේය. (4) දින 14 ක් තබාගත් බැටලු පැටවාය.

17. ක්‍රිස්තුන් වහන්සේ අප හා සමඟ සදහටම ජීවත් වීමට ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානයකි.

(1) පූජාත්වරය (2) ප්‍රසාද ස්නාපනය (3) දිව්‍ය සත්ප්‍රසාදය (4) පාපොච්චාරණය

18. යාච්ඤාව හා පශ්චාත්තාපිත ක්‍රියා මගින් ලෝකයේ පාපී බලවේග පරාජය කිරීම අරමුණු කරගනිමින් ආරම්භ කළ සංවිධානයකි,

(1) මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව (2) සාන්ත වින්සන් ද පාවුලා සමිතිය

(3) කිතුදන පුබුදුව (4) දේවමාතා දරු සංගමය

19. අපගේ විශ්වාසයේ මූලාශ්‍රය වන්නේ,

(1) දේවානුභාවයෙන් යුතු ශුද්ධ ලියවිල්ල ය.

(2) ප්‍රේමයෙන් අපට අනාවරණය කරන දෙවියන් වහන්සේ ය.

(3) ජීවිතාදර්ශ සපයන ශුද්ධවන්තයන් ය.

(4) අපෝස්තුලුවරුන්ගේ විශ්වාස ලක්ෂණය ය.

20. 'එකම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීම පාපී ඇල්මෙන් ජීවත් වන මිනිසාව එයින් නිදහස් කිරීමකට යොමු කරවන්නේය." මෙම ප්‍රකාශය උපුටා ගනු ලබන්නේ,

(1) කතෝලික සභා ධර්මෝපදේශයෙන් ය. (2) මහෝපදේශයෙන් ය.

(3) හිතෝපදේශයෙන් ය. (4) ශාසන නීති සංග්‍රහයෙන් ය.

21. පොරොන්දු දෙමින් ලබා ගත යුතු සක්‍රමේන්තුවකි.

(1) පාපොච්චාරණය (2) දිව්‍ය සත්ප්‍රසාදය

(3) රෝගීන්ගේ ආලේපය (4) ප්‍රසාද ස්නාපනය

22. ධනය, බලය, කීර්තිය, දේපළ පසුපස හඹා යාම විරුද්ධ වන්නේ,

(1) පළමු පනතටය. (2) තෙවන පනතටය.

(3) හත්වන පනතටය. (4) දහවන පනතටය.

23. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා අප විසින් සිදුකළ යුතු පළමු ණය යුතුකම වන්නේ,

(1) ඉරුදින නිවාඩු ලබා ගැනීමය. (2) පුණ්‍ය ක්‍රියාවල යෙදීමය.

(3) දිව්‍ය පූජාවට සහභාගී වීමය. (4) වන්දනා ගමන්වලට සහභාගී වීමයි.

24. දෙවියන් වහන්සේගෙන් මිනිසා ලබා ඇති අමිල දීමනා වන්නේ,

(1) ශරීර සෞඛ්‍යය හා පරිසරයය. (2) ජීවිතය හා පරිසරයය.

(3) ජීවිතය හා සැප සම්පත්ය. (4) ජීවිතය හා ශරීර සෞඛ්‍යයය.

25. ගබ්සාව බරපතල පාපයක් වන්නේ,

(1) නිරපරාදේ ජීවිතයක් විනාශ වන නිසාය.

(2) පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති නිසා ය.

(3) පාපොච්චාරණයේ දී මෙම පාපයට එකවර සමාව දීමට පියතුමාට නොහැකි නිසා ය.

(4) බිළිඳු මරණයක් සිදුවන නිසා ය.

26. ජීවිතය ස්තුති පූර්වකව පිළිගෙන දෙවියන් වහන්සේගේ මහිමය හා අපගේ ආත්ම ගැලවීම සඳහා ආරක්ෂා කිරීම අපට පැවරී ඇති,

(1) ණය යුතුකමකි. (2) පොරොන්දු ඉටුකිරීමකි.

(3) ආදරය ප්‍රකාශ කිරීමකි. (4) ජීවිත පරිත්‍යාගයකි.

27. මයෑදාව නමැති යහගුණය උපදින ප්‍රදාන ධර්මගුණය වන්නේ,

(1) ප්‍රේමයය. (2) හික්මවීමය.

(3) බලාපොරොත්තුවය. (4) පිරිසිදුකමය.

28. 6 හා 9 පනත්වලට අදාළ ව කන්ද උඩ දේශනාවේදී ක්‍රිස්තුන් වහන්සේ කළ ඉගැන්වීමකි.

(1) 'නිහතමානි ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දේශය උරුමකර ගන්නෝය.

(2) 'දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දයාව ලබන්නෝ ය.'

(3) 'නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය.'

(4) 'යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය. ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.'

29. අන් සතු දෙයක් ලැබුණු විට ආපසු බාරදීම මගින් අප අනුසාර කරන්නේ,

(1) 9 හා 10 පනත්ය. (2) 8 හා 9 පනත්ය.

(3) 7 හා 8 පනත්ය. (4) 7 හා 10 පනත්ය.

30. ''මාගේ පුත්‍රය, පියාගේ අවවාද අසන්න. මවගේ උපදෙස් ඉවත නොදමන්න.'' මෙසේ සඳහන් වන්නේ,

(1) හිතෝපදේශය 1/8 හි ය. (2) කොලොස්සි 3/20 හි ය.

(3) උපදේශකයා හෙවත් සිරාක් 7/27 හි ය. (4) එපීස 6/1 හි ය.

31. අටවන දේව පනතට විරුද්ධ පාපයකි.

(1) අන් අයගේ අයහපත ගැන සතුටු වීම. (2) පාපොච්චාරණයේදී වැරදි සැඟවීම.

(3) අනුන්ගේ කාලය නාස්ති කිරීම. (4) කොපිකර, වංචාකර විභාග සමත්වීම..

32. විශ්වාසයේ සත්‍යතා සඳහා දෙනු ලබන උතුම්ම සාක්ෂියකි

(1) ආදර්ශවත්වීම. (2) ප්‍රාණපරිත්‍යාගීවීම.

(3) විශ්වාසය ප්‍රකාශ කිරීම. (4) පරිත්‍යාගශීලීවීම.

33. "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ' යන විශ්ව ලේඛනය ඉදිරිපත් කරන්නේ,

(1) අති උතුම් IV වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.

(2) අති උතුම් II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.

(3) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.

(4) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.

34. ජනවන්දනාව තුළ සතියේ වැදගත්ම දිනය වන්නේ,

(1) ඉරුදිනය ය. (2) සෙනසුරාදා දිනය ය.

(3) ආලේලුයියා සෙනසුරාදා දිනය ය. (4) පාස්කු ඉරුදිනය ය.

35. ජනවන්දනාවසරේ 'ශ්‍රී ලංකා අප ස්වාමිදූගේ මංගල්‍යය' සිදුකරනු ලබන මාසය වන්නේ,

(1) ජනවාරි ය (2) පෙබරවාරි ය (3) නොවැම්බර් ය (4) ඔක්තොම්බර් ය

36. 'පරුසියා' යන්නෙන් අදහස් කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ,

(1) පළමු පැමිණීමය. (2) දෙවන පැමිණීමය. (3) මාංශගතවීමය. (4) දුක්විදීමය.

37. ආගමන සමය තුළ සමරන වැදගත් මංගල්‍යයකි.

(1) මරියතුමිය ජන්ම දෝෂයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීමේ මංගල්‍යය

(2) ශුද්ධවූ පවුලේ මංගල්‍යය.

(3) කානික්ක මංගල්‍යය.

(4) දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය.

38. ජනවන්දනා වසරේ ප්‍රධානතම හා ප්‍රථම මංගලෝත්සවය වන්නේ,

(1) පාරිශුද්ධ දේවමාතාවන්ගේ මංගල්‍යය (2) ක්‍රිස්තු උත්පත්ති මංග්‍යය.

(3) ක්‍රිස්තු උත්ථාන මංගල්‍යය. (4) දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය.

39. මුලසුනේ පළමු යැදුම වන්නේ,

(1) ආචාරයය. (2) ග්ලෝරියාය.

(3) ස්තෝත්‍ර යාගික යැදුමය (4) පොදු යැදුමය.

40. පහත සඳහන් ප්‍රකාශ අතරින් මල් උයනේ යාච්ඤාව හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,

A ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යයත්වය ය.

B තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීමය.

C ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීමය.

D ඔවුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියයි.

(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය** **කතෝලික ධර්මය II** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

1. පාවුලුතුමා ලිපි ලියා ඇති කණ්ඩායම් දෙකක් ලියන්න.
2. පේදුරුතුමාගේ මහා ප්‍රකාශයේ අඩංගු කරුණු දෙකක් ලියන්න.
3. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දේව ප්‍රේමයට විරුද්ධ පව් දෙකක් ලියන්න.
4. තුන්වන පනතට අනුව නිවාඩු වලංගු කරවන දින දෙකක් ලියන්න.
5. සදාචාර සම්පන්න සමාජයක් බිහිකිරීම සඳහා රාජ්‍ය පාලකයින්ගේ හා පුරවැසියන්ගේ යුතුකම් දෙකක් ලියන්න.
6. පස්වන පනතට අනුව 'මෝඩයා' හා 'ජඩයා' කියා ගරහන අයවලුන්ට අයත්වන දඬුවම් මොනවාද?
7. නිර්මල සිතක් හා පිවිතුරු දිවියක් ගත කිරීමට මග පෙන්වන පනත් දෙක නම් කරන්න.
8. අටවන දේව පනතට අනුව ජීවත්වීමට නියම කර ඇති කරුණු දෙකක් ලියන්න.
9. ජනවන්දනා වර්ෂය තුළ සුදු වර්ණය භාවිතා කිරීමෙන් අර්ථවත්වන කරුණු දෙකක් ලියන්න.
10. කිතුනු සභා ප්‍රකාශ වශයෙන් බෙදී ඇති කොටස් දෙක නම් කරන්න. (ල. 2x10=20)

02. 1. ද්විතීය පාවුලු සංදේශ දෙක නම් කරන්න.

2. පාවුලුතුමාට කිතුනු සංඝ පෞද්ගලිකව හමුවිය නොහැකි අවස්ථාවල ලිපි මාර්ගයෙන් කළ මගපෙන්වීම් තුනක් ලියන්න.
3. වර්තමාන සමාජය තුළ දහම් සේවයේ නියුතු විශ්වාසකයින්ට පාවුලුතුමා දුන් ආදර්ශයන් කරුණු පහක් යටතේ ලියා දක්වන්න. (ල. 2+3+5=10)

03. 1. ශුද්ධවූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාගේ ආදර්ශ පාඨය ලියන්න.

2. ගරු මයිකල් රුද්‍රිගු පියතුමා දිළිඳු ජනතාව මුල්කරගනිමින් කරන ලද ව්‍යාපාර තුළින් ඉස්මතු වූ කරුණු තුනක් ලියන්න.

3. ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් කිතුණුවෙකු වූ ඔබ, වර්තමාන සමාජයට ආදර්ශයක් වන්නේ කෙසේදැයි කරුණු පහක් ඇසුරෙන් ලියා දක්වන්න. (ල. 2+3+5=10)

04. 1. එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ හැකි ආකාර දෙකක් ලියන්න.

2. ලූක් 1: 46-48 ට අනුව, මරිය උදාන ගීයෙහි සඳහන් ප්‍රශංසාත්මක වැකි තුනක් ලියන්න.

3. දේව පනත් අනුසාර කිරීමෙන් පාපී දිවියෙන් එතෙර වන්නට ඔබ කරන යෝජනා පහක් සඳහන් කරන්න. (ල. 2+3+5=10)

05. 1. මහෝපදේශය 361 ට අනුව පෞද්ගලික දේපළ පිළිබඳව කරන ඉගැන්වීම් දෙකක් ලියන්න.

2. 1 කොරෙන්ති 6:10 ට අනුව දේව රාජ්‍ය උරුම කර නොගන්නා කණ්ඩායම් තුනක් ලියන්න.

3. දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීමට පෞද්ගලික දේපළ නිවැරදිව පරිහරණය කරන ආකාරය කරුණු පහකින් ලියා දක්වන්න. (ල. 2+3+5=10)

06. 1. නත්තල් සමය ආරම්භක සහ අවසාන මංගල්‍යයන් දෙක ලියා දක්වන්න.

2. ශුද්ධවූ සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයන් තුනක් නම් කරන්න.

3. සැබෑ ජීවිත පෙරළියක් අත්දකින්නට ක්‍රිස්තු ආගමනය ඔබ පිටිවහලක් කරගන්නා ආකාරය කරුණු පහකින් විස්තර කරන්න. (ල. 2+3+5=10)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. ගරු. මයිකල් රුද්‍රිගු පියතුමා
2. ශු. මරිය ගොරෙත්තිතුමිය
3. දේව වාක්‍ය පිළිවෙත
4. ස්තෝත්‍ර යාගික පිළිවෙත

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 1 ) | 03. ( 2 ) | 04. ( 1 ) | 05. ( 3 ) | 06. ( 4 ) | 07. ( 2 ) | 08. ( 2 ) | 09. ( 1 ) | 10. ( 1 ) |
| 11. ( 3 ) | 12. ( 4 ) | 13. ( 2 ) | 14. ( 1 ) | 15. ( 4 ) | 16. ( 3 ) | 17. ( 3 ) | 18. ( 1 ) | 19. ( 2 ) | 20. ( 1 ) |
| 21. ( 4 ) | 22. ( 1 ) | 23. ( 3 ) | 24. ( 4 ) | 25. ( 2 ) | 26. ( 1 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 1 ) |
| 31. ( 2 ) | 32. ( 2 ) | 33. ( 3 ) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 2 ) | 37. ( 1 ) | 38. ( 3 ) | 39. ( 4 ) | 40. ( 2 ) |

(ල. 40)

## II පත්‍රය

01.
1. විවිධ සංඝවලට හා පුද්ගලයන්ට (පි. 07)
2. ඔබ ක්‍රිස්තුවරයාණෝය. ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝය. (පි. 30)
3. දේව ආදරය පිළිබඳ මෙනෙහි කිරීම. දේව ප්‍රේමයට ප්‍රතිචාර නොදැක්වීම.
දිව්‍යමය වූ යහපතින් කෙනෙකුව වළක්වාලීම.
උඩඟුවෙන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම. (පි. 70)
4. ඉරුදින, ණය මංගල්‍ය දිනය (පි. 70)
5. 10 පෙළපොත පිටු අංක 79 (17 පාඩම)
6. මෝඩයා - ශ්‍රේෂ්ඨාධිකරණය / ජඩයා - නිරාගින්නට ගොදුරුවීම (පි. 82)
7. 6 වන පනත - කාමමිථ්‍යාචාරය නෙකරව.
9 වන පනත - පරදාර ආලය නොකරව (පි. 88)
8. සත්‍යවාදීවීම, සත්‍යයට සාක්ෂි දැරීම (පි. 101)
9. ශුද්ධවත් බව, මහිමාන්විතබව, ආනන්දය (පි. 111)
10. පිළිගත් කිතුණු සභා සහ මූලධර්මවාදී සභා (පි. 123) (ල. 2x10=20)

02.
1. එපීස හා කොලොස්සි (පි. 8, 9)
2. ගැටලු නිරාකරණය කිරීම / විශ්වාසය ස්ථිර කිරීම, අවවාද අනුශාසනා දීම/ දේව ධාර්මික හා එඩිරික උපදෙස් දීම. (පි. 7)
3. දේව අනාවරණයට නතුවීම / අභියෝගවලට මුහුණ දීම හා ජය ගැනීම / දුක් කම්කටොළු ඉවසීමෙන් දරා ගැනීම / ශුද්ධාත්මයාණන් තුළ යැපීම / පසුබට නොවීම ආදී කරුණු 05 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 2+3+5=10)

03.
1. යමෙකු තමන්ගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවෙකුට නැත. (පි. 61)
2. වතු කම්කරුවන් උදෙසා හඬක් නැගීම. / සාමය හා සාධාරණත්වය පිළිබඳ හඬ නැගීම. / ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් හා මානව සංවර්ධය වෙනුවෙන් හඬ නැගීම. (පි. 63)
3. ♦ පැවරෙන යුතුකම් හා වගකීම් නිසිලෙස ඉටුකිරීම. ♦ දුක්වේදනා ඉවසීමෙන් දරා ගැනීම. ♦ අභියෝගවලට මුහුණ දීම. ♦ දෙවියන් වහන්සේට විශ්වාසවන්තව ජීවත් වීම. ♦ සත්‍යයට සාක්ෂි දැරීම. ♦ සංවේදී වීම ආදි කරුණු 05 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 2+3+5=10)

04.
1. ♦ අපි ඔවුන් වහන්සේට නමස්කාර කරමු. ♦ අපි ඔවුන් වහන්සේට යාච්ඤා කරමු. ♦ අපි ඔවුන් වහන්සේට යාග පුද කරමු. ♦ අපි ඔවුන් වහන්සේට බාරහාර වෙමු. පොරොන්දු දෙමු. (පි. 65)
2. මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදම් අනයි. එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සලකා වදාළ සේක. 'හැම පරපුරක්ම මෙතැන් සිට භාග්‍යවන්තිය'යි මට කියනු ඇත. (පි. 67)
3. දස පනත අනුසාර කරමින් ජීවත්වන ආකාරය පිළිබඳව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(ල. 2+3+5=10)

05.
1. ♦ තමන්ගේත්, තම පවුලේත්, නඩත්තුව සඳහා සෑහෙන දේපළක් හිමිකර ගන්නට අයිතියක් ඇත. ♦ පොදු දේපල යුක්ති සහගතව හා සාධාරණව බෙදී යා යුතුයි. ♦ තම යහපත සඳහා පමණක් නොව අන්අයගේ යහපත සඳහාද විය යුතුයි. ♦ දිළිඳුන්ට ආධාර කළ යුතුයි.
2. සොරු, කොල්ලකන්නෝ, ලෝබයෝ, බේබද්දෝ, නින්දාකරන්නෝ, ගසාකන්නෝ
3. ♦ සාධාරණ ලෙස උපයා ගැනීම. ♦ දිළිඳු අයට උපකාර කිරීම. ♦ තම දේපල අන්අයගේ යහපත සඳහාද යෙදවීම. ♦ ලැබෙන වැටුපට සරිලන සේවයක් කිරීම. ♦ පොදු දේපළ පෞද්ගලික දේපළක් බවට පත්කර නොගත යුතුයි. ... ආදී ගැලපෙන කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න.
(ල. 2+3+5=10)

06.
1. ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය සහ ජේසුස් වහන්සේගේ ප්‍රසාද ස්නාපන මංගල්‍යය. (පි. 108)
2. ගොබ් ඉරුදින, මහ බ්‍රහස්පතින්දා, මහ සිකුරාද, ආලේලූයියා සෙනසුරාදා (පි. 109)
3. ♦ සැබෑ මනස්ථාපනයක් ඇතිකර ගැනීම. ♦ ගැලවුම්කරුවාණන් පිළිගැනීමට සූදානම් වීම. ♦ බෙදාහදා ගැනීම. ♦ ලෞකිකත්වයට මුල්තැන නොදීම. ♦ ජනවන්දනාවට අර්ථවත්ව සහභාගී වීම ආදී පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 2+3+5=10)

07.
1. (පි. 62, 63) 2. (පි. 89) 3. (පි. 117, 118) (ල. 2+3+5=10)